සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2018 | 11 ශ්‍රේණිය
மூன்றாம் தவணைப் பரீட்சை2018 | தரம்11
**Second Term Test 2018** | **Grade 11**

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II
**சிங்களமொழியும் இலக்கியமும் II**
**Business & Accounting studies II**

පැය දෙකයි
**மூன்று மணித்தியாலம்**
***Three hours***

**පළමු ප්‍රශ්නය ඇතුළුව 1 කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, 11 කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් (i) සිට(x) දක්වාප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .

ලංකාවේ ප්‍රධාන පෙලේ පාවහන් නිෂ්පාදන සමාගමක සේවකයෙකු ලෙස වසර දහයක සේවා කාලයක් සම්පූර්ණ කළ හර්ෂණ සේවයෙන් ඉවත්ව 2017 01.01 දින සිට තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කලේ පාවහන් නිපදවීම පිළිබඳ කර්මාන්ත අමාත්‍යාංශ යටතේ පවත්වනු ලැබූ පාඨමාලාවක් හැදෑරීමෙන් ලත් දැනුමද සහිතවය.තමා සතුව තිබූ රු.500,000ක මුදලද තම පියාගෙන් උරුමවූ රු.1200,000 ක් වටිනා ගොඩනැගිල්ලද ආරම්භයේදීයොදාගත් අතර ජනවාරි 05 දින ලබාගත් රු.100 000 බැංකු ණය මුදලද ව්‍යාපාරයට යොදවන ලදී.

මීට අමතරව ව්‍යාපාරයේ පළමු මාසය තුල සිදුවූ ගනුදෙනු මෙසේය.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය මිලදී ගැනීම | රු. | 50 000 |
| උපකරණ මිලට ගැනීම් | රු. | 10 000 |
| සේවක වැටුප් ගෙව්වා | රු. | 12 000 |
| පාවහන් විකිණීමෙන් ලැබුණා | රු. | 75 000 |
| ප්‍රවාහන වියදම් ගෙව්වා | රු. | 5 000 |

ව්‍යාපාරික ගොඩනැගිල්ල වාර්ෂිකව 10% බැගින් ක්ෂය කිරීමට තිරණය කර ඇත.

“ස්ටයිල් වොර්ක්” නමින් පවත්වාගෙන යන මෙම නිෂ්පාදන ආයතනයේ නිෂ්පාදන ගුණාත්මක බවින් ඉහල බැවින්ද නවීන මෝස්තර වලින් යුක්ත බැවින්ද ක්‍රම ක්‍රමයෙන් සාර්ථකත්වය කරා ගමන් කරමින් සිටී.

හර්ෂණ ව්‍යාපාරය තවදුරටත් පුළුල් කළ යුතු බවත් විධිමත්ව ,ස්ථාවරව හා නෛතික පුද්ගල භාවයක් සහිතව ව්‍යාපාරය වර්ධනය කළහැකි ක්‍රමවේද පිළිබඳව අධ්‍යානය කරමින් සිටී.

(i) (අ) “ස්ටයිල් වොර්ක්”කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් ව්‍යාපාරයක්ද ?

(ආ) මෙම ව්‍යාපාරය තුල ඔබ දකින ව්‍යාපාරික ශක්තියක් ලියන්න

(ii) “ස්ටයිල් වොර්ක්” පාවහන් ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න

(iii) මෙම ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශව දෙකක් සඳහන් කොට එම පාර්ශවයන් ඇල්ම දැක්වීමට හේතුවූ කරුණ බැගින් ලියන්න .

(iv) හර්ෂණ අපේක්ෂා කරන ආකාරයට “ස්ටයිල් වොර්ක්” ව්‍යාපාරය පුළුල් කරන්නේ නම් ඒ සඳහා වඩාත්ම සුදුසු යයි ඔබ යෝජනා කරන්නේ කුමන වර්ගයේ ව්‍යාපාර සංවිධානයක් ද?

(v) හර්ෂණගේ ව්‍යාපාරයේ 2017 .01.01 දිනට ගිණුම්කරන සමීකරණය පවතින තත්වය අගයන් සහිතව ලියා දක්වන්න .

(vi) මෙම ව්‍යාපාරය සතු ජංගම නොවන වත්කම් මොනවාද? අගයන් සහිතව ලියා දක්වන්න.

(vii) රු.50 000 ක ද්‍රව්‍ය මිලදී ගැනීමට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න.

(viii) ව්‍යාපාරයේ මාසය අවසානයේ අත ඉතිරි මුදල ගණනය කොට පෙන්වන්න.

(ix) ගොඩනැගිල්ලේ මාසයට අදාළ ක්ෂය ප්‍රමාණය කොපමණද ?

(x) ව්‍යාපාරයේ මාසයට අදාළ ලාභය හෝ අලාභය කොපමණද?

(ලකුණු2 x 10 = 20)

## 1 කොටස

02. i) අ) ජීවත්වීම සඳහා මිනිසා විසින් අනිවාර්යයෙන් සපුරා ගත යුතු දෑ අවශ්‍යතා ලෙස හැඳින්වේ.අවශ්‍යතා සඳහා උදාහරණ දෙකක් සපයන්න .

ආ) වුවමනා තුල දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න .

ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.

අ) භාණ්ඩ හුවමාරු ක්‍රමය වෙළඳපල බිහිවීමේ මූලික අවස්ථාවයි.

ආ) වර්තමාන වෙළඳපොල ක්‍රියාකාරීත්වය නිසා වුවමනා සංකීර්ණ වීම ප්‍රභලවම සිදුවේ.

ඉ) ‘සේවක සුභසාධනය’ ලාභ අපේක්ෂිත ව්‍යාපාරයක ප්‍රධාන අරමුණකි.

ඊ) ‘සන්නිවේදනය’ මිනිස් වුවමනාවක් වන අතර ‘ජංගම දුරකථනය’ අවශ්‍යතාවයකි.

iii) අ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේදී යොදා ගැනෙන විවිධ සම්පත් නිෂ්පාදන සාධක ලෙස හැඳින්වේ. මූලික නිෂ්පාදන සාධක නම් කරන්න.

ආ) පදම්කල පන්කොළ යොදා ගමන් මලු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක නිෂ්පාදන සාධක ලෙස යොදාගන්නා භූමියට හා ප්‍රාග්ධනයට සුදුසු උදාහරණ එක බැගින් ලියන්න.

iv) අ) තාක්ෂණික පරිසරයේ සිදුව ඇති වෙනස්වීම් ව්‍යාපාර විසින් තම කාර්යයන් පහසු කරගැනීමට යොදාගත් අවස්ථා අද බහුලවම දක්නට ලැබෙයි. උදාහරණයක් මගින් මෙම කියමන පැහැදිලි කරන්න

ආ) අඛන්ඩ පැවැත්මක් සහිත ,නීතිමය පුද්ගල භාවයක් සහිත කොටස් නිකුතුවෙන් ප්‍රාග්ධනය රැස්කර ගන්න d ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න .

(ලකුණු02 x 04 = 08)

03. i) අ) සංචාරක සිල්ලර වෙළඳාම සඳහා නිදසුන් දෙකක් සපයන්න

ආ) ශ්‍රී ලංකාව ආනයනය කරනු ලබන භාණ්ඩ වර්ග හතරක් ලියන්න.

ii) අ) විද්‍යුත් මුදල් භාවිතය කෙරෙහි ගනුදෙනු කරුවන්ගේ උනන්දුව ක්‍රමයෙන් වැඩි වෙමින් පවතී විද්‍යුත් මුදල් භාවිතයේ වාසි දෙකක් ලියන්න.

ආ) චෙක්පතක්‘පිටසන් කිරීම’ යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

iii) ‘රක්ෂ්‍ය හිමිකම’ යන මූලධර්මය පැහැදිලි කර එයට නිදසුනක් සපයන්න.

iv) අ) සන්නිවේදනය පිලිබඳ අවබෝධයකින් තොරව කටයුතු කිරීමෙන් ගැටළු වලට මුහුණ දීමට ව්‍යාපාරයකට සිදුවේ. ඔබ හඳුනාගත් එවැනි ගැටළුවක් පැහැදිලි කරන්න.

ආ)ශ්‍රීලංකාවේ ප්‍රවහන ක්ෂේත්‍රයේ මෑතකාලීන ප්‍රවණතා දෙකක් ලියන්න.

(ලකුණු 02 x 04 = 08)

04) i) අ) කළමනාකරණය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

ආ) සාර්ථක සැලසුම්කරණයක් තුලින් ව්‍යාපාරයට අත්කර ගත හැකි වාසි දෙකක් ලියන්න.

ii) පහත සඳහන් කාර්යයන් කුමන කළමනාකරණ මූලිකාංගයට අයත් වන්නේ දැයි දක්වන්න

A සේවකයින් සඳහා විධිමත් සුභ සාදන වැඩ පිළිවෙලක් පවත්වාගෙන යාම.
B ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීම.
C ව්‍යාපාරයේ සම්පත් නිසි පරිදි අවශ්‍යා පාර්ශව වෙත බෙදාහැරීම.
D සැලසුම් වල පවතින අඩුපාඩු හඳුනා ගැනීම

iii) අ) වෙළඳාම නිර්වචනය කරන්න.
ආ) අවකාශීය වෙළඳපොල යනුවෙන් කුමක් අදහස් වේද?

iv) අ) එදිනෙදා පාරිභෝගික කටයුතු වලදී සෘජු බෙදාහැරීමේ ක්‍රමය භාවිතාවන අවස්තාවක් ලියා දක්වන්න.
ආ) රෙදිපිළි ව්‍යාපාරයක් සඳහා සුදුසු විකුණුම් ප්‍රවර්ධනය ක්‍රම දෙකක් ලියන්න.
(ලකුණු 02 x 04 = 08)

## 11 කොටස

05. i) (අ) ගිණුම් කරණය යනු කුමක්ද?
(ආ) අයිතිකරුගේ හිමිකම වෙනස්වීමට බලපාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 02 )

ii) (අ) ව්‍යාපාරයක වගකීම් වල දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න.
(ආ) වගකීම් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කොට දැක්විය හැකියි. එම කොටස් දෙක නම් කරන්න.
(ලකුණු 02)

iii) පහත සඳහන් ගනුදෙනු ගිනුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.
තසිරුවිසින් ආරම්භ කරනලද වෙළඳ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.
(1) රු. 500 000 ක ප්‍රාග්ධනයක් යෙදීම.
(2) රු. 200 000 ක බැංකු ණයක් ලබා ගැනීම.
(3) රු. 50 000 අත්පිට මුදලට භාණ්ඩ ගැනීම.
(4) රු. 10 000 ව්‍යාපාරික ගොඩනැගිලි කුලී ගෙවීම. (ලකුණු 04)

iv) ඉහත(iii) කොටසේ සඳහන් ගනුදෙනු උපයෝගී කරගෙන පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ගනුදෙනුව | මූලාශ්‍රලේඛනය | හර වන ගිණුම | බැර වන ගිණුම |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |

(ලකුණු04)

06. i) විරාන් තම ව්‍යාපාරික කටයුතු පහසු කරගැනීමේ අදහස ඇතිව වාණිජ බැංකුවක ජංගමක් පවත්වාගෙන යනු ලබයි 2017 මැයි මස ඔහු විසින් පිළියෙළ කළ බැංකු ගිණුමට අනුව බැංකු ශේෂය වූයේ රු.16500 ක වාසිදායක ශේෂයකි. එම මස ලද බැංකු ප්‍රකාශයට අනුව පෙනී ගියේ එම ශේෂයන් අතර වෙනසක් ඇති බවයි. එම වෙනසට හේතුවූ කරුණු මෙසේ හඳුනාගෙන ඇත .

1. ස්ථාවර නියෝග මතබැංකුව විසින් ගෙවාතිබූ රක්ෂණ ගාස්තු රු.5000 කි.

2. රු. 16 000 ක් වූ අංක 234324 දරන චෙක්පත බැංකුවේ තැන්පත් කර ඇතිමුත් 2017.05.31 දිනට නිෂ්කාශනය වී නොතිබිණි.

3. බැංකුවට ලැබී තිබුණු සෘජු ප්‍රේෂණ වල වටිනාකම රු.8 000 කි.

4. රු. 2 0 000 ක වටිනාකමකින් යුත් 564358 දරන චෙක්පත නිකුත් කලද 2017.05.31 වන තෙක් බැංකුවට ඉදිරිපත් කොට නැත .

අවශ්‍යා වන්නේ, 01. සංශෝධිත බැංකු ගිණුම
02. 2017.05.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය
(ලකුණු 06)

ii) එක්තරා ව්‍යාපාරයක් 2017.1231 දිනට පිළියෙළකරන ලද ශේෂපිරික්සුමෙහි හර තීරුවෙහි එකතුව බැරතීරුවෙහි එකතුවට සමාන නොවීය. එහි හර පැත්තේ රු. 9000 අඩුවක් දක්නට ලැබුණු අතර එයට හේතුවූ වැරදි කිහිපක් අනාවරණය විය.

1. ණයට විකුණුම් රු.5600 විකුණුම් ජ'නලයේ සටහන් කර ඇත්තේ රු.6500 ක් ලෙසය .
2. ගෙවූසේවක වැටුප් රු.8500 සටහන් කර ඇත්තේ මුදල් ගිණුමෙහි පමණි.
3. ගෙවූ රක්ෂණ ගාස්තු රු.2500 ක් වරිපනම් ගාස්තු ගිණුමට හර කර ඇත.
4. ණය හිමියන්ට ගෙවූ රු. 12500 ණය හිමි ගිණුමේ සටහන්ව ඇත්තේ රු.12000ක් ලෙසය.

අවශ්‍ය වන්නේ,

අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළජ'නල සටහන්
ආ) අවිනිශ්චිත ගිණුම.

07. i) අ) ව්‍යාපාරයක බොල් ණය යනුවෙන් හැඳින්වෙන්නේ මොනවාද?
ආ) බොල්ණය සටහන් තැබීමේ ද්විත්ව සටහන ලියා දක්වන්න .

ii) ප්‍රභාත් ගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| ගිණුම | හර (රු.) | බැර(රු.) |
|---|---|---|
| ආරම්භක තොගය | 30 000 | |
| ප්‍රාග්ධනය | | 500 000 |
| විකුණුම් | | 450 000 |
| ගැනුම් | 300 000 | |
| ණය හිමියෝ | | 20 000 |
| ණය ගණතියෝ | 45 000 | |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) | 400 000 | |
| යන්ත්‍ර (පිරිවැයට) | 120 000 | |
| 10% බැංකු ණය | | 50 000 |
| පරිපාලන වේතන | 30 000 | |
| ප්‍රචාරණ ගාස්තු | 10 000 | |
| ගැනිලි | 5 000 | |
| බැංකු ණය පොලී | 4 000 | |
| විදුලි ගාස්තු | 12 000 | |
| බෙදා හැරීමේ වියදම් | 12 000 | |
| අතැති මුදල | 5 2000 | |
| | 1 020 000 | 1 020 000 |

අමතර තොරතුරු :

- 2017.12.31. දිනට තොගය (පිරිවැයට) රු.12500
- යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතුය.
- ණය ගතියන්ගෙන් රු. 1000 ක් බෝල් ණය ලෙස කපා හරිය යුතුය.

අවශ්‍ය වන්නේ,

i) 2017.1231 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදායම් ප්‍රකාශනය (ලකුණු04)

ii) 2017.1231 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04)